**2013.05.16 හා 2014.06.20 දිනයන් හි පැවති 162 වැනි හා 174 වැනි සනාතන සභාව මගින් පත්කරන ලද කමිටුව විසින් සකස් කරන ලද විභාග පරිපාටි අක්‍රමිකතා හා දඬුවම් රෙගුලාසි මාලාව (සංශෝධිත) - 2014**

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ**

* දැනට බලපවත්නා විභාග පරිපාටි, විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ (සංශෝධිත) 2008 අතුරු ව්‍යාවස්ථාව සාකච්ඡාවට භාජනය කරන ලද අතර එම අතුරු ව්‍යාවස්ථාවේ විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ රෙගුලාසි පමණක් සංශෝධනය කර ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව **මෙම රෙගුලාසි, "1989 අංක 1 දරණ විභාග පරිපාටි, අක්‍රමිකතා සහ දඬුවම් රෙගුලාසි මාලාව (සංශෝධිත) 2014" ලෙස හඳුන්වනු ලබන අතර 2015 අගෝස්තු මස 20 දින සිට ක්‍රියාත්මක වේ.**

02. **විභාග අක්‍රමිකතා**

විභාග අක්‍රමිකතා මතු දැක්වෙන ආකාරයට කෙටියෙන් වර්ග කර ඇත.

01. අනවසර ලිපි ලේඛන සන්තකයෙහි තබා ගැනීම
02. කොපි කිරීම සහ ලුටනය (Plagiarism)
03. වංචා කිරීම
04. විශ්වවිද්‍යාලයට අයත් විභාග ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙන යෑම
05. අනිසි හැසිරීම
06. විභාග අපේක්ෂකයෙකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම
07. ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැන ගැනීම හෝ දැන ගැනීමට තැත් කිරීම
08. යම් විභාග වරදක් කිරීමට ආධාර හෝ අනුබල දීම හා ලබා ගැනීම
09. විභාග පරීක්ෂකවරුන්ට, නිරීක්ෂකවරුන්ට සහ අනිකුත් විභාග නිලධාරීන්ට අනිසි බලපෑම් කිරීම හා උපදෙස් පිළිනොපැදීම
10. යම් විභාග අක්‍රමිකතාවයකට දෙවන වරටද වරදකරුවකු වීම
11. විභාග ශාලාව තුළ යම් අපේක්ෂකයකු විසින් සෙලියුලර් දුරකථන හෝ එබඳු සන්නිවේදන උපකරණ හෝ වෙනත් අනවසර උපකරණ භාවිත කිරීම හෝ ළඟ තබා ගැනීම
12. සනාතන සභාව මගින් පිළිගන්නා වෙනත් ඕනෑම විභාග අක්‍රමිකතාවක් කිරීම

03. **විභාග අක්‍රමිකතා සඳහා දඬුවම්**

01. අනවසර ලිපි ලේඛන සන්තකයෙහි තබා ගැනීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය එක් (01) සමාසිකයකටත් උපරිමය සමාසික තුනකටත් (03) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.

02. කොපි කිරීම සහ ලුටනය (Plagiarism)

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය එක් (01) සමාසිකයකටත් උපරිමය සමාසික තුනකටත් (03) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.

03. වංචා කිරීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය එක් (01) සමාසිකයකටත් උපරිමය සමාසික දෙකකටත් (02) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.

04. විශ්වවිද්‍යාලයට අයත් විභාග ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම.

05. අනිසි හැසිරීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය එක් (01) සමාසිකයකටත් උපරිමය සමාසික තුනකටත් (03) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.

06. විභාග අපේක්ෂකයෙකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය සමාසික හතරකටත් (04) උපරිමය සමාසික අටකටත් (08) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. **මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.**

දෙවන පාර්ශවකරු ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක නම් අවමය සමාසික හතරකටත් (04) උපරිමය සමාසික අටකටත් (08) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. **මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.**

දෙවන පාර්ශවකරු ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක නොවේ නම් දෙවන පාර්ශවකරු විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක නොවන අවස්ථාවක එම පුද්ගලයාට විරුද්ධව අධිකරණයේ නඩුවක් පැවරීමට විශ්වවිද්‍යාලයට නිදහස ඇත.

07. ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට තැත් කිරීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය එක් (01) සමාසිකයකටත් උපරිමය සමාසික දෙකකට (02) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.

08. යම් විභාග වරදක් කිරීමට ආධාර හෝ අනුබල දීම හා ලබා ගැනීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම.

09. විභාග පරික්ෂකවරුන්ට, නිරික්ෂකවරුන්ට සහ අනිකුත් විභාග නිලධාරින්ට අනිසි බලපෑම් කිරීම හා උපදෙස් පිළිනොපැදීම

**දඬුවම්:**

විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත දඬුවම් පැමිණවීම.

10. යම් විභාග අක්‍රමිකතාවකට දෙවන වරටද වරදකරුවකු වීම

**දඬුවම්:**

ශිෂ්‍යභාවය අවලංගු කිරීම.

11. විභාග ශාලාව තුළ යම් අපේක්ෂකයකු විසින් සෙලියුලර් දුරකථන හෝ එබඳු සන්නිවේදන උපකරණ හෝ වෙනත් අනවසර උපකරණ භාවිත කිරීම හෝ ළඟ තබා ගැනීම

**දඬුවම්:**

විභාග අක්‍රමිකතාව සිදුකළ විෂයට අදාළ ප්‍රතිඵල අවලංගු කොට අවමය එක් (01) සමාසිකයකටත් උපරිමය සමාසික තුනකටත් (03) විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාල විභාග තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත වෙනත් දඬුවම් පැමිණවීම. මෙම දඬුවම් කාලය වරද කළ සමාසිකයට පසුව එළැඹෙන සමාසිකයේ ආරම්භක දිනයේ සිට ක්‍රියාත්මක වේ.

12. සනාතන සභාව මගින් පිළිගන්නා වෙනත් ඕනෑම විභාග අක්‍රමිකතාවක් කිරීම

**දඬුවම්:**

විශ්වවිද්‍යාලයීය විනය කමිටුවේ නිර්දේශය මත දඬුවම් පැමිණවීම.

**04. වෙනත් දඬුවම්**

ඉහත නියම කර ඇති දඬුවම් වලට අමතරව විනය කමිටුවේ නිර්දේශය මත පහත සඳහන් දඬුවම් ක්‍රියාත්මක කළ හැක.

01. පන්ති සාමාර්ථ්‍යක් නොදීම
02. අවලංගු කළ ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටීමේදී උපරිමය සාමාර්ථ්‍යයකට (“C” Grade) සීමා කිරීම
03. ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර මුදල් අවලංගු කිරීම හෝ අත්හිටුවීම
04. උපාධි ප්‍රදානෝත්සවයට නොකැඳවීම (අනභිමුඛව උපාධි ප්‍රදානෝත්සවයට කැඳවීම)
05. ප්‍රතිඵල හා අනෙකුත් අදාළ ලේඛන නිකුත් කිරීම වර්ෂයකින් ප්‍රමාද කිරීම

**විභාග අක්‍රමිකතාවයේ ස්වභාවය සැලකිල්ලට ගෙන ඉහත පරිච්ඡේද වල සඳහන් දඬුවම් වැඩි කිරීමට විශ්වවිද්‍යාලයීය විනය කමිටුවට නිදහස ඇත. කමිටුවේ සියළුම නිර්දේශිත දඬුවම් නියම කිරීම විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අනුමැතිය මත සිදුකරණු ලැබේ.**

<u>පැහැදිලි කිරීම</u>

| | | | |
|---|---|---|---|
| 1. | විශ්වවිද්‍යාලයීය සනාථන සභාව | - | සනාථන සභාව යන්නෙන් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙන් පිහිටුවා ඇති රජරට විශ්වවිද්‍යාලයීය සනාථන සභාව යන්න අදහස් වේ. |
| 2. | ශිෂ්‍යභාවය | - | ශිෂ්‍යභාවය යන්නෙන් රජරට විශ්වවිද්‍යාලය විසින් අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් ශිෂ්‍යයෙකු සඳහා ලබාදෙන නීත්‍යානුකූල ශිෂ්‍ය ලියාපදිංචිය අදහස් වේ. |
| 3. | සමාසිකය | - | අධ්‍යයන වර්ෂයක වර්ෂ අර්ධයක් අදහස් වේ. |